**ලුණුගල ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති

ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අනුව අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ එකතුකිරීම් වටිනාකම රු.869,805 ක් වුවද, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.1,062,661 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | රු.192,856 වැඩියෙන් සටහන් වූ වරද සමුච්චිත අරමුදල් හා ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම් රු.192,856 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රු.192,856 ක් අඩුවෙන් සටහන් වූ රක්ෂණ වියදම ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම හා ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයේ වියදම් ණය හිමි ලෙස ගිණුම්ගතකර තිබුණු රු.360,243 ක් සමාලෝචිත වර්ෂයේදී පියවා තිබුණද, මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස දක්වා තිබුණි. | ණය හිමි ලෙස සටහන් වූ රු.360,243 ක් ජංගම බැරකම් ලෙස නැවත සටහන් වීමේ වරද බැරකම් ශේෂයෙන් අඩුකර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වන වෙනත් අයභාර රු.15,585,603 ක් විය යුතු වුවද, එය රු.14,082,735 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙහෙයුම් අයභාර රු.1,502,868 ක් අඩුවෙන් සටහන් වීමෙන් වූ වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය හා පැරණි ජල උපාංග අතැති තොගයේ වටිනාකම රු 1,440,864.ක් වූ අතර යාවත්කාලීන කරමින් ගබඩා ලෙජරය නඩත්තු නොකිරීම නිසා එම වටිනාකම සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | විධිමත් ගබඩා ලෙජරයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දුන් බව. | ගබඩා ලෙජරය විධිමත්ව යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23 (ආ) | සභාව මගින් එකතු කරනු ලබන අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරියෙන් පරිසර බලපත්‍රය ඉල්ලුම් කළ නමුත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ තිබුණ අඩුපාඩු නිසා බලපත්‍රය ලබා ගැනීමට නොහැකි විය. ඒවා නිවැරදි කර නැවත අයදුම්පත්‍රය යොමු කිරීමට නියමිත බව. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ අඩුපාඩු සකස් කර පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතුය. |
| (ආ) | 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ 2 ඡේදය | සභාවේ සභිකයින් 20 දෙදෙනෙකු 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | මන්ත්‍රීවරුන් මේ පිළිබඳ දැනුවත් කර තිබුණද 2022 වර්ෂයට අදාළ වත්කම් බැරකම් ප්‍රකාශය ජී. ලෝගනාදන් මන්ත්‍රීතුමා පමණක් ලබා දී ඇත. ඉදිරියේදී සෑම සභිකයෙකුගෙන්ම වත්කම් බැරකම් ප්‍රකාශය ලබා ගැනීමට කටයුතු කරන බව. | වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.13,972,065 ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,101,431 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල්කල ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල්කල ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 1,082,800 | 1,180,110 | 717,725 | 462,385 | 255,500 | 256,701 | 169,256 | 87,445 |
| (ii) | කුලී | 7,409,700 | 3,207,707 | 2,018,886 | 1,188,821 | 4,688,709 | 2,730,958 | 2,127,160 | 603,798 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,186,000 | - | 840,634 | (840,634) | 708,000 | - | 331,436 | (331,436) |
| (iv) | වෙනත් ආදායම් | 5,500,000 | 4,384,685 | 1,124,595 | 3,260,090 | 6,066,540 | 10,596,528 | 2,068,339 | 8,528,189 |
| | එකතුව | 15,178,500 | 8,772,502 | 4,701,840 | 4,070,662 | 11,718,749 | 13,584,187 | 4,696,191 | 8,887,996 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොම්පෝස්ට් කළ නොහැකි ඝණ අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැරකරලීම සිදු නොකළ යුතු අතර, හැකිතාක් දුරට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන් කර ප්‍රතිචක්‍රීකරණයට යොමු කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණු අතර, කසළ දෛනිකව වෙන් කිරීමෙන් පසු නොදිරන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පරිශ්‍රයතිම විවෘතව බැහැර කර තිබුණි. | ඉදිරියේදී බිම් පිරවුමක් සකසා දිරාපත් නොවන කසළ බැහැර කිරීමට යෝජිත බව. | විධිමත් පරිදි කසළ බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේදි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සූරියගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩමක් කසළ අංගනයක් ඉදිකිරීමට බදු පදනම මත ලබාගෙන, එකී ඉඩමෙහි පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් රු.6,383,675 ක් වැය කර කසළ අංගන දෙකක්, කොම්පෝස්ට් පොහොර ගබඩා කිරීමේ කාමර හා කසළ හලන යන්ත්‍රයක් මිළදී ගෙන සවිකර තිබුණි. තෙකලා විදුලි සම්බන්ධතාවය ගැනීමට2022 ජූලි 06 දිනය දක්වාම පියවර ගෙන නොතිබීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබූ අතර, සභා බල ප්‍රදේශය තුළ වාර්ෂිකව එක්රැස් වන කසළ ටොන් 42 ක් පමණ ට්‍රැක්ටර් රථයක්, අත් කරත්තයක් හා සේවකයින් 09 දෙනෙකු යොදවාගෙන අක්‍රමවත් ලෙස ගොඩ ගසා තිබුණි. | LDSP ව්‍යාපෘතිය මගින් විදුලි ජනක යන්ත්‍රයක් ලබා ගැනීමට යෝජිත බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ජල සම්පාදන අමාත්‍යාංශයේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 180 ක් හා ප්‍රාදේශීය සභා අරමුදලින් රුපියල් මිලියන 59 ක් වැය කර ලුණුගල නගරයේ ජල ව්‍යාපෘතිය යටතේ සියලු උපාංග වලින් සමන්විත ජල සාම්පල පරීක්ෂා කිරීමේ රසායනාගාරයක් සහ බස් නැවතුම්පොළේ වැසිකිළි පද්ධතිය ඉදිකර 2022 වර්ෂයේදී සභාවට පවරා දී තිබුණි. ජල සාම්පල පරීක්ෂා කිරීමේ රසායානගාරයට රසායනික ද්‍රව්‍ය හා උපකරණ ලබාදී තිබුණද, රසායනාගාරයේ කටයුතු පවත්වාගෙන යාමට සුදුසුකම් සහිත රසායනාගාර ශිල්පියෙකු හෝ සහායකයින් බඳවා නොගැනීම හේතුවෙන් රසායනාගාරයේ ජල සාම්පල පරීක්ෂා කිරීම සිදු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/wp/10/cdlg/la-04 සහ 2023 මාර්තු 23 දිනැති ලිපිය මගින් කොන්ත්‍රාත් පදනම මත පත් කරන ලද නිළධාරිනිය වැඩ භාර ගැනීමට නොපැමිණි බැවින් රසායනාගාරයේ කටයුතු ආරම්භ කිරිමට නොහැකි වූ බව. | සුදුසු නිලධාරියෙකු බඳවාගෙන රසායනාගාරයේ කටයුතු ආරම්භ කළ යුතුය. |